## විද්‍යෝදය විද්‍යාලංකාර පිරිවෙන්වල අභාවය

සාහිත්‍යයෙහි දී හෝ වේවා විද්‍යාවෙහි දී හෝ වේවා කෘතියකට පිළිගැනීමක් ලැබෙන්නේ සමාජයෙහි උගතුන් අතර පිළිගැනීමක් ලැබීමෙන් පසුව යැයි අපි කීවෙමු. එහෙත් මෙහි දී සාකච්ඡා නොවූ වැදගත් ප්‍රශ්නයක් වෙයි. එනම් සමාජයෙහි උගතුන් ලෙස පිළිගැනෙන්නේ කවුරුන් ද යන්න ය. උගතුන් කවුද යන්න, විශේෂයෙන් ම ඉහත සඳහන් ආකාරයේ පිළිගැනීමක් ලබාදෙන උගතුන් කවු ද යන්න තීරණය කෙරෙන්නේ දේශපාලන හා සංස්කෘතික ආධිපත්‍යය පදනම් කර ගනිමිනි.

ඉතා පැහැදිලිව ම අද මෙරට තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරනු ලබන්නේ බටහිර ශාස්ත්‍ර හා විද්‍යා උගතුන් විසිනි. ඇතැම් විට බටහිර දැනුම කටගාගත් යම් යම් ජනමාධ්‍යකරුවන් අතින් ද ඒ සිදුවෙයි. ඊනියා සාහිත්‍ය පිටු සකස්කරන්නෝ ද මෙරට උගතුන් කවුද යන්න පාඨකයන්ට හඳුන්වා දෙති. ඉතා පැහැදිලිව ම මෙරට උගතුන් ලෙස අද හැඳින්වෙන්නේ බටහිර අච්චුවේ සාහිත්‍ය, නාට්‍ය, සිනමා, කාව්‍ය ආදී ක්ෂේත්‍රවල නිර්මාණකරුවන් ය. එසේත් නැත්නම් බටහිර ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, බටහිර දර්ශනය ආදී විෂය හැදෑරුවන් ය. ඉඳහිට බටහිර විද්‍යාව හැදෑරූ කිහිප දෙනෙක් ද උගතුන් ලෙස හැඳින්වෙති.

අද ප්‍රාචීන පඬිවරුන්ට මෙරට තැනක් නැත. ප්‍රාචීන පඬිවරයකු අතරින් පතර සිටිය ද ඔහු ද බටහිර ශාස්ත්‍ර හදාරා ඒ පිළිබඳ ව ද දැනුමක් ලබාගැනීමට වෙහෙසෙයි. විද්‍යෝදය විද්‍යාලංකාර පිරිවෙන්වලට ඊනියා විශ්වවිද්‍යාල තත්වය දීමේ ප්‍රතිඵලය වූයේ ප්‍රාචීන පඬිවරුන්ට තිබූ සමාජයීය දේශපාලන බලය මුළුමනින් ම නැතිකිරීම ය. අද පිරිවෙන්වල ද දහම් පාසල්වල ද ඉගැන්වෙනුයේ බටහිර අච්චුවට අනුව ය.

විසිවැනි සියවසේ මුල්භාගයේ ද සිංහල, පාළි, සංස්කෘත, බෞද්ධ දර්ශනය පෙරදිග ආකාරයට උගත් ප්‍රාචීන පඬිවරුන්ට යම් තරමක වුව ද පිළිගැනීමක් මෙරට විය. එදා බොහෝ පඬිවරු ව්‍යාකරණානුකූලව සිංහලෙන් ලියූහ. බොහෝ පුවත්පත් ලේඛකයන්ට ද ඒ හැකියාව විය. කණගාටුවෙන් වුවත් කිවයුත්තේ මාර්ටින් වික්‍රමසිංහ මහතාට ඒ හැකියාව නො වූ බව ය. ඒ මහතාගේ පොත්පත්වල තිබූ වැරදි එකල සිටි පඬිවරුන්ගේ විවේචනයට හසුවිය. එහෙත් වික්‍රමසිංහ මහතා අයත්වූයේ නැගී එන බටහිර ක්‍රිස්තියානි නූතනත්ව සම්ප්‍රදායට ය. පඬිවරු අයත්වූයේ අවරට යමින් තිබූ සිංහල බෞද්ධ සම්ප්‍රදායට ය. එවැවින් අවසානයේ දී ජයග්‍රහණය වික්‍රමසිංහ මහතාට හිමිවිය.

බටහිරයන්, විශේෂයෙන් ම ඉංගිරිසින්, අධ්‍යාපනය ඔස්සේ ගෙන ගිය බටහිර ක්‍රිස්තියානි නූතනත්ව ආධිපත්‍යය පැතිරවීම අපට යම් දේශපාලන නිදහසක් ලැබෙන විට ඵල දරා තිබුණි. අපට යම් දේශපාලන නිදහසක් ලැබුණේ සංස්කෘතික ආධිපත්‍යය මුළුමනින් ම මෙන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට භාරදෙමිනි. නිදහස් අධ්‍යාපනය, ගමට උසස් අධ්‍යාපනය, එනම් බටහිර උසස් අධ්‍යාපනය ගෙනයෑමේ ප්‍රතිඵලය වූයේ බටහිර ශාස්ත්‍ර උගතුන්ට ශාස්ත්‍රීය සමාජයේ දේශපාලන බලයක් ලැබීම සහ භික්ෂූන්වහන්සේ ප්‍රමුඛ ප්‍රාචීන පඬිවරුන්ට එකී දේශපාලන බලය නැතිවීම ය.

ඉංගිරිසි කතානොකරන සිංහල බෞද්ධයෝ බටහිරයන් යටතේ තමන්ට තැනක් නැතිබව තේරුම්ගත්ත ද බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිකාධිපත්‍යයට විරුද්ධව සටන් කළ ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එරෙහිව සටන්කිරීමේ අවශ්‍යතාව දැන නොසිටියහ. පනස්හයට අප පිවිසියේ මේ අඩුපාඩුව ද සහිතව ය. පනස්හයේ බලවේගයේ නායකත්වය සඟ, වෙද, ගුරු බලවේගයට හිමිවුණ ද අප නොදැනුවත්ව මෙන් ඇතැම් සිංහල ගුරුවරු හා වෙදමහත්වරු බටහිර නූතනත්වය ගමට ගෙන යෑමේ මුල් පියවර ද ගත්හ. ගමට බටහිර උසස් අධ්‍යාපනය ලැබීමට පෙර ම ඔවුහු තම පුතුන්ට බටහිර අධ්‍යාපනය ලබාදීමට නගරයට යැවූහ. ඒ ඔවුන්ගේ වරදක් නො වේ. සමාජ ආධිපත්‍යය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට හිමි වූ කල ඔවුන්ට වෙනත් කළහැකි දෙයක් නො වී ය.

පනස්හය පමණක් නොව එයට පනස්වසරකට පමණ පසුව උදා වූ දෙදහස්පහ ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අභියෝගකර නැත. ඒ අවස්ථා දෙකෙහි ම සිංහල බෞද්ධයන් තමන්ට හිමි තැන දිනාගැනීමට උත්සාහගත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව රාමුවෙහි ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්ව දැනුමට අභියෝග කිරීමට තරම් ශක්තිමත් දැනුම්

© Prof. Nalin De Silva

පද්ධතියක් නොමැති විට එසේ වීම පුදුමයක් නොවිය යුතු ය. පනස්හයේ දී අප සටන් කෙළේ සිංහලෙන් බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි නිර්මාණය වූ දැනුම ලබාගැනීමට ය. අපි ඒ දැනුමට අභියෝග නො කෙළෙමු.

ඉංගිරිසි කතා නොකරන සිංහලයෝ ඉංගිරිසි කතා නොකර ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි තමන්ට තැනක් දෙස ඉල්ලා සිටිය හ. ඔවුහු බටහිර ක්‍රිස්තියානි නූතනත්ව දැනුම් ආධිපත්‍යය පිළිගත්හ. ඔවුන්ට තම අධ්‍යාපනික මූලස්ථානවලට බටහිර සමාජයීය පිළිගැනීමක් අවශ්‍ය විය. විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් එවකටත් විශ්වවිද්‍යාල වුවත්, එහි ප්‍රාචීන පාඨමාලා බොහෝ දෙනකු කියන ආකාරයට ලංකා විශ්වවිද්‍යාලයට වඩා ඉහළ මට්ටමක පැවතියත්, ඔවුහු ඉන් සෑහීමකට පත් නොවී බටහිර විශ්වවිද්‍යාල ආකෘතිය ඉල්ලා සිටියහ. එහි ප්‍රතිඵලය වූයේ ප්‍රාචීන පඬිවරුන් ක්‍රමයෙන් සමාජයෙන් කොන්වී යෑම ය.

පිරිවෙන්වලට බටහිර විශ්වවිද්‍යාල ආකෘතිය ලැබීමත් සමග සිදුවූයේ පිරිවෙන් බටහිර විශ්වවිද්‍යාල ආකෘතිය තුළ ගිලී යෑම ය. ඒ සමග එතෙක් ප්‍රධාන පීඨ බවට පත්ව තිබූ බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ දර්ශනය ආදී පීඨ බටහිර අච්චුව අනුව ගොස් ශාස්ත්‍ර පීඨයේ හෝ මානව ශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන අංශ පමණක් බවට පත්විය. ඒ සමග මානව ශාස්ත්‍ර පීඨය ද ධුරාවලියෙහි පහතට තල්ලු කර දැම්මි. අද තම නම් ද අහිමි කරගෙන ඇති මේ විශ්වවිද්‍යාල දෙක තවත් බටහිර විශ්වවිද්‍යාල දෙකක් බවට පත් වී ඇත.

ඒ විශ්වවිද්‍යාල පිහිටුවීමේ දී ඉංගිරිසි කතානොකරන සිංහල බෞද්ධයන් පේරාදෙණියේ ලංකා විශ්වවිද්‍යාලයට වෙනස් විශ්වවිද්‍යාල දෙකක් ඇති වේ යැයි බලාපොරොත්තු වන්නට ඇත. පේරාදෙණිය ඉංගිරිසි කතානොකරන සිංහල බෞද්ධයන් කොන්කරන ප්‍රතිපත්තියක් අනුගමනය කෙළේ ය. එහි පළමු උපකුලපති වූ අයිවර් ජෙනිංග්ස් කොළඹ කාන්තා විද්‍යාලයේ දී කරන ලද කතාවකට අනුව ලංකාව සංස්කෘතික කාන්තාරයක් විය. ඔහු වෙනත් වචනවලින් කියා ඇත්තේ සිංහල බෞද්ධයනට සංස්කෘතියක් නැති බව ය. එසේ වුවත් ඉංගිරිසි කතානොකරන සිංහල බෞද්ධයන් පේරාදෙණියට විරුද්ධව වුවත් අවසානයේ දී දැන හෝ නොදැන හෝ ඉල්ලා ඇත්තේ පිරිවෙන් වෙනුවට පේරාදෙණිය අච්චුවේ විශ්වවිද්‍යාලයක් ඇතිකරන ලෙස ය.

අවුරුදු පනහකට පසු ඒ ලැබී ඇතිවා පමණක් නොව අද එහි බොහෝ පීඨවල ඉගැන්වීමේ මාධ්‍යය ද ඉංගිරිසි වී ඇත. පිරිවෙන් විශ්වවිද්‍යාල පනතේ සඳහන්කර තිබුණේ ඒ විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය සිංහලෙන් ලබා දිය යුතු බව ය. එහෙත් ඉංගිරිසි කතානොකරන සිංහල බෞද්ධයන් බොහෝ දෙනකු එයට කැමතිවා පමණක් නොව ඔවුන් දැන් සිතන්නේ ඔවුන්ට සමාජයේ තැනක් නොලැබුණේ පනස්හයෙන් පසුව ඔවුන්ට ඉංගිරිසි නූගැන්වීම නිසා බව ය. අද සියල්ල ඉංගිරිසියට (හා තොරතුරු තාක්ෂණයට) ලඝුකර ඇත. මේ ආණ්ඩුව ද මේ වසර ඉංගිරිසි හා තොරතුරු තාක්ෂණය වෙනුවෙන් වෙන්කර ඇත.

එහි ඇති වරද කුමක් දැයි කිසිවකු ප්‍රශ්න කරනු ඇත. බැලූ බැල්මට එහි වරදක් නැත. එහෙත් මේ සියල්ල සමග බටහිර අච්චුවේ නොවන උගතුන් තව තවත් කොන්වනු ඇත. ඒ සමග අපේ අධ්‍යාත්මය ද පිරිහෙනු ඇත. නැණසල පන්සලට ගෙන යෑමෙන් සිදුවන්නේ පන්සලට අළුත් අගයක් ලැබීම නොව නැණසල යම් දිනෙක පන්සල අභිබවා යෑම ය. මිනිසුන් විශේෂයෙන් ම තරුණ තරුණියන් පන්සල් යනු වෙනුවට නැණසල් යනු ඇත. නැණසල ඔස්සේ දරුවන් පන්සලට හෙන්වාගත හැකි යැයි යමකු සිතන්නේ නම් ඒ මුළාවකි. නැණසල් යන කී දෙනෙක් බුදුන් වඳින්නට යත් ද?

අද බුදුන් වහන්සේ දෙසූ දහම වුව ද පිළිගැනීමට සමාජය පෙළඹෙන්නේ ඒ දැනුම බටහිර විද්‍යාවෙන් තහවුරුවන තරමට ය. බටහිර විද්‍යාව ක්‍රමයෙන් සමාජයේ ප්‍රධාන දැනුම් පද්ධතිය බවට පත්වෙමින් පවතියි. බටහිර ජීවත්වන බටහිර විද්‍යාඥයෝ අද ප්‍රධාන ප්‍රඥයෝ වෙති. එහෙත් ලංකාවේ බටහිර විද්‍යා ආචාර්ය මහාචාර්යවරුන් ඉතා වැඩි පිරිසකට සමාජයේ එතරම් පිළිගැනීමක් නැත. ඒ වෙනුවට සමාජයේ පිළිගැනීම ඇත්තේ, එනම් උගතුන් ලෙස පිළිගැනීමට ලක්වන්නේ බටහිර විද්‍යාව පසුපස නොන්ඩි ගසමින් යන බටහිර සමාජයීය විද්‍යා හා ඊනියා මානව ශාස්ත්‍ර හැදෑරූ උගතුන්ය. (මෙහි නොන්ඩි ගසන්නේ ඒ ඒ විද්‍යා හා ශාස්ත්‍ර බව අවධාරණය කළ යුත්තේ උගතුන් නොන්ඩි ගැසීමටවත් නොදන්නා බැවිනි.)

© Prof. Nalin De Silva

මෙරට බටහිර විද්‍යා ආචාර්ය මහාචාර්යවරුන් උගතුන් ලෙස එතරම් පිළිගැනීමකට ලක්නොවන්නේ බටහිර විද්‍යාව මෙරට මුල්බැසගත් ක්ෂේත්‍රයක් නොවීම හේතුවෙනි. මෙරට මුල්බැසගෙන ඇත්තේ බටහිර වෙදකම හා ඉංජිනේරු තාක්ෂණය මිස බටහිර විද්‍යාව නො වේ. දක්ෂ සිසුන්ට අවශ්‍ය එක්කෝ බටහිර වෛද්‍යවරයකු වීමට ය. නැත්නම් ඉංජිනේරුවරයකු වීමට ය. මෙරට විශ්වවිද්‍යාලවල විද්‍යා පීඨවලට ඇතුල්වන්නේ ඉතා වැඩි වශයෙන් ම ඉංජිනේරු පීඨයකට හෝ වෛද්‍ය පීඨයකට හෝ ඇතුල්වීමට නොහැකිවූවන් ය. විද්‍යා පීඨවලටත් ඇතුළත්වීමට නොහැකි වූවෝ ආයුර්වේදය ඉගෙනීමට යති! කෙතරම් දැඟළුවත් බටහිර විද්‍යාවට මෙරට මුල්බැසගැනීමට නොහැකි වී ඇත. ඉඳහිට දක්ෂ ශිෂ්‍යයකු දෙදෙනකු ඉංජිනේරුවන් හෝ වෛද්‍යවරුන් හෝ වීමට උත්සාහ නොගෙන විද්‍යා පීඨවලට ඇතුල්වීමෙන් මේ තත්වයේ වෙනසක් නො සිදුවෙයි.

එයට හේතුව ඉංජිනේරුවකු හෝ වෛද්‍යවරයකු හෝ වීමෙන් වැඩි ආදායමක් ලබාගැනීමට හැකිවීම ම නො වේ. මෙරට බටහිර විද්‍යාව ඉගැන්වීමට ඉංගිරිසින් කල්පනා කෙළේ ම විද්‍යාඥයන් බිහිකිරීමට නොව ඉංජිනේරු හා වෛද්‍ය වෘත්තීන්ට සිසුන් පුහුණු කිරීමට ය. එසේ පුහුණු කිරීම එංගලන්තයේ සිට වෛද්‍යවරුන් හා ඉංජිනේරුවන් ගෙන ඒමට වඩා ලාභදායක කටයුත්තක් විය. කෙසේ වුවත් ඒ ඔස්සේ ඒ වෘත්තීන්ට සමාජයේ පිළිගැනීමක් ලැබුණි. අනෙක් අතට අපේ රටේ සම්ප්‍රදාය අනුව ද අප වැඩි සැලකිල්ලක් දැක්වූයේ සංයුක්ත තාක්ෂණයට මිස වියුක්ත ප්‍රවාද නිර්මාණයට නො වේ. ඒ කෙසේ වෙතත් වෛද්‍යවරුන්ට හා ඉංජිනේරුවන්ට සමාජයීය පිළිගැනීමක් ලැබුණත් ඔවුන්ට උගතුන් ලෙස පිළිගැනීමක් නො ලැබිණි, එයට හේතුව ඒ වන විට නයිදෙලා හා වෙදමහතුන් සමාජය විසින් උගතුන් ලෙස නොපිළිගනු ලැබීම ය. මෙරට උගතුන් ලෙස අවසානයේ දී පිළිගැනුණේ ධර්ම විනය දැනගත් භික්ෂූන්වහන්සේ හා අවශේෂ ගිහි පිරිස ය. සිංහල වෙදමහතුන්, ගොවිමහතුන් හා නයිදෙලා බටහිරයන් විසින් කොන්කරනු ලැබූ සමාජයක අවසානයේ දී දේශීය සම්ප්‍රදායක් රැකගෙන සිටියේ ප්‍රධාන වශයෙන් ම භික්ෂූන් වහන්සේ හා කලින් සඳහන් ගිහි පිරිස් ය. අවසාන වටයේ දී බටහිරයන් විසින් කොන්කරනු ලැබූ ඒ සම්ප්‍රදාය රැකගත් උගතුන් වෙනුවට උගතුන් ලෙස කරළියට පැමිණීමට හැකිවූයේ බටහිර මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා උගත් අයට මිස ඉංජිනේරුවන්ට හා වෛද්‍යවරුන්ට නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva